# <u>ආපනශාලා ලංසු ඉල්ලුම් පත්‍රය</u>

1. ආයතනයේ නම : ……………………………………………………..........…
2. ඉල්ලුම්කරුගේ නම :……………………………………………………………
3. මුල් අකුරු සමඟ නම සහ ලිපිනය : ............................................................................................
4. ජාතික හැඳුනුම්පත අංකය : ……………………………………………..........…
5. ව්‍යාපාර ලියාපදිංචි අංකය : ……………………………………………………...
6. දුරකථන අංක: ස්ථාවර : ............................................................................................

   ජංගම : ............................................................................................
7. විද්‍යුත් තැපැල් ලිපිනය : ............................................................................................
8. ආපනශාලව සඳහා මාසිකව ගෙවීමට එකඟවන කුලිය : ........................................................

   (අ) ඉලක්කමෙන් : ……………………………………………………………......

   (ආ) අකුරෙන් : ........................................................................................................

මෙයට යා කර ඇති ලංසු කොන්දේසි වලට යටත්ව යටත් වන බවත් ආහාර ද්‍රව්‍ය නාම ලේඛනය හා ආහාර ද්‍රව්‍යවල මිල ගණන් දැක්වෙන ලේඛනයේ සඳහන් මිල ගණන්වලට ආහාර සැපයීමට එකඟ වන බවත් ක්‍රීඩා අමාත්‍යාංශ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ "Sports Cafe" ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුමට එකඟ වන බවත් පහත අත්සන් කරන මම එකඟ වෙමි.

……………………………………………………පදිංචි...............................................................

වන මම මෙම ලංසුව ඉදිරිපත් කරමි.

මේ සමග සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමය වෙත ගෙවන ලද රු. 1,000/=ක ආපසු නොගෙවන තැන්පතුවේ කුවිතාන්සියේ මුල් පිටපත මේ සමග අමුණා ඇත.

ඉදිරිපත් වන ඕනෑම ලංසු ලියවිල්ලක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමය සතුවන බවත් දනිමි.

දිනය :.............................. ....................................

අයදුම්කරුගේ අත්සන
නිල මුද්‍රාව තබන්න

සාක්ෂිකරුගේ අත්සන : ……………………………………………..

හැඳුනුම්පත් අංකය : ……………………………………….....

නම සහ ලිපිනය : …………………………………………………………………

## ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුහසාධක හා ක්‍රීඩා සංගමයේ "Sports Cafe" ආපන ශාලා පවත්වාගෙන යාම

### පොදු ලංසු කොන්දේසි

1) ලංසු අයදුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් මගින් ලංසු අයදුම්පත ලබාගත යුතුය.

2) **ලංසු ගාස්තු**

ලංසු පෝරම ලබාගැනීම සඳහා රු.1,000/-ක ආපසු නොගෙවන ගාස්තුවක් "භාණ්ඩාගාරික, ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුහසාධක හා ක්‍රීඩා සංගමය" වෙත ගෙවා ලබාගත් කුවිතාන්සියක් සියලුම අයදුම්කරුවන් විසින් ලංසු ලේඛනය සමඟ ඉදිරිපත් කල යුතුය.

3) **ලංසු ආකෘති පත්‍ර නිකුත් කිරීම**

2022.10.07 දින සිට 2022.10.13 දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ක්‍රීඩා අමාත්‍යාංශයේ ගිණුම් අංශයෙන් ලබා ගත යුතුයි.

4) **ලංසු ආකෘති පත්‍රවල වෙනස් කිරීම**

අයදුම්කරුවන් විසින් ආහාර උපලේඛණයේ මිල ගණන් වල හැර ලංසු කොන්දේසිවල වෙනත් කිසිම සංශෝධනයක්, වෙනස් කිරීමක් නොකළ යුතුය. ආහාර උපලේඛණයේ මිල ගණන් වල වෙනසක් කර ඇති තැන්වල හා මකා ඇති තැන්වල තම අත්සන යොදා සහතික කළ යුතුය.

5) **මිල ගණන් වල වලංගු කාල සීමාව**

ඉදිරිපත් කරනු ලබන මිල ගණන්, මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කල දින සිට වසරක කාල සීමාවක් දක්වා වලංගු විය යුතුය. විශේෂ අවස්ථා වලදී පමණක් මිල ගණන් වෙනස් කිරීමට ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුහසාධක හා ක්‍රීඩා සංගමයේ අනුමැතිය මත පමණක් සිදුකල හැකිය.

6) **ලංසු ඉදිරිපත් කල යුතු අන්දම**

අයදුම්කරුවන් විසින් අත්සන් කරන ලද ලංසුවේ මුල් පිටපත **"ක්‍රීඩා අමාත්‍යාංශ සේවක සුහසාධක හා ක්‍රීඩා සංගමයේ "Sports Cafe" ආපන ශාලා පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම 2022/2023"** යනුවෙන් වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර සභාපති, ක්‍රීඩා අමාත්‍යාංශ සේවක සුහසාධක හා ක්‍රීඩා සංගමය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07. යන ලිපිනයට 2022.10.14 දින ප.ව. 2.00ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුයි.

7) **මිල ගණන් සඳහන් කිරීම**

අයදුම්කරුවන් විසින් ලංසු පත්‍රයට යා කර ඇති උපලේඛණයේ සඳහන් කර ඇති සියළුම ද්‍රව්‍ය සඳහා මිල ගණන් සඳහන් කල යුතුය.

8) **ලංසු භාර ගැනීම හා විවෘත කිරීම**

2022.10.14 දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වූ වහාම 2වන මහල කුඩා ශ්‍රවනාගාරයේදී ලංසු විවෘත කරනු ඇත. ලංසු විවෘත කරන වේලාවට අයදුම්කරුට හෝ බලයලත් නියෝජිතයෙකුට පැමිණ සිටිය හැක.

9) **ව්‍යාජ මිල ගණන් ඉදිරිපත් කිරීම**

පවතින වෙළඳපොල මිල ගණන් හා සසඳන විට පිළිගත නොහැකි මිල ගණන් ඉදිරිපත් කර ඇති ලංසු ක්‍රිඩා අමාත්‍යාංශ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ විධායක කමිටුව විසින් නම් කළ කමිටුවක් විසින් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. එවැනි අවස්ථාවලදී ඉතිරි ලංසු සලකා බැලීමට ක්‍රිඩා අමාත්‍යාංශ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමය විසින් නම් කළ විධායක කමිටුවට බලය ඇත.

11) **ලංසු ඇගයීම් නිර්ණායක**

ලංසු ඇගයීමේදී පහත කරුණු කෙරේ සැලකිල්ලක් දක්වනු ලැබේ.

- ආහාර වල මිල ගණන් (අමාත්‍යාංශ පරිශ්‍රයේ කාර්යය මණ්ඩලය හා බාහිර පුද්ගලයින් සඳහා)
- ආපනශාල අවම මාසික කුලිය අවමය රු.40,000/= කි.
- පළපුරුද්ද පිළිබඳ සහතික
- අංක ගණිතමය වැරදි සඳහා කරනු ලබන ගැලපීම්
- ඉදිරිපත් කරනු ලබන ලංසු වල අංගසම්පූර්ණ බව
- ලංසු විවෘත කරන දිනට මාස 06 ක් නොඉක්ම වූ රුපියල් පන් ලකෂයක් (රු. 500,000/=) නොඅඩු මුදලකට ප්‍රාදේශිය ලේකම් විසින් පොදු 170 ආකෘතියෙන් නිකුත් කරනු ලැබූ වත්කම් සහතිකයක් හෝ බැංකු ශේෂ සනාථ කිරීමේ ලිපියක්.
- අවම වශයෙන් පසුගිය ආසන්න වසර 02 ක කාලය තුළ රජයේ හෝ රජයට අනුබද්ධිත ආයතන 02 ක ( එකි ආයතන වල අවම වශයෙන් එක් වසරක්වත් සේවා කාලය) හෝ අඛණ්ඩව එක් ආයතනයක වසර 02 ක් ආපනශාලා පවත්වා තිබිය යුතුය. (සේවා සහතික අමුණා එවිය යුතුය)
- රජයේ ගිවිසුම් කොන්දේසි කඩකර අසාධු ලේඛනගත නොවී තිබිය යුතුය.

ගරු සභාපති,
ක්‍රිඩා අමාත්‍යාංශ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමය,
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
අංක 09, පිළිපි ගුණවර්ධන මාවත,
කොළඹ 07.

.........................................මස....................................දින ඉහත සඳහන් ලංසු කොන්දේසි වලට මම/අපි එකඟ වෙමි/වෙමු.

දිනය : ……………………………………..

නම/නම් : ………………………………………………………………………

හැඳුනුම්පත් අංකය : …………………………......................................……………

# ගිවිසුම

වර්ෂ 2022...ක් වූ.......................................................දින කොළඹ දී ඇති කර ගන්නා ලද ගිවිසුම අනුව කොළඹ 07, පිලිප් ගුණවර්ධන මාවත. අංක 09 ස්ථානයේ පිහිටා ඇති ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ ගරු සභාපති මින් මතුවට "ගරු සභාපති" යනුවෙන් හඳුන්වනු ලබන එකී ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ ගරු සභාපති හෝ ඔහුගේ නිල අනුප්‍රාප්තිකයෙකු **පළමු පාර්ශවය** ලෙසත්,

මින් මතු ඉදිරියට "කොන්ත්‍රාත්කරු" ලෙස හඳුන්වනු ලබන .......................................................................................................................................... දරන ස්ථානයේ පදිංචි සහ.........................................................................................හි තම ලියාපදිංචි ව්‍යාපාරික ස්ථාන පිහිටා ඇති...........................................................................නාමයෙන් පවත්වාගෙන යන ව්‍යාපාරයේ හිමිකරු වන ....................................................................(ජා.හැ.අ......................................)
යන මින් මතුවට "කොන්ත්‍රාත්කරු" යනුවෙන් හඳුන්වනු ලබන අය සහ ඔහුගේ අනුප්‍රාප්තිකයන් **දෙවන පාර්ශවය** ලෙසත්,

එකිනෙකා සමඟ බැඳී පහත සඳහන් කොන්දේසි සහ ගිවිසිලි මත ඇති කර ගනු ලබන ගිවිසුමයි.

සෑම පුද්ගලයෙකුටම තනි තනිව "පාර්ශව" ලෙසත් ඒකාබද්ධව "පාර්ශව" ලෙසත් සලකයි.

එමෙන්ම, කොන්ත්‍රාත්කරු ආහාර සැපයීමේ ව්‍යාපාර කරගෙන යන හවුල්කාරීත්වයක් වන අතර ශ්‍රී ලංකා ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ 'Sports Cafe" ආපනශාලාව ක්‍රියාත්මක කිරීමේ පළපුරුද්ද සහ හැකියාව පවතින අතර මෙතැන් සිට සඳහන් කර ඇති පරිදි නියමනයන් හා කොන්දේසි අනුව අවශ්‍ය පරිදි ආයතනයට සිය සේවාවන් සැපයීමට කොන්ත්‍රාත්කරු එකඟ වේ.

එකී ගිවිසුමේ කොන්දේසි සහ නියාමනයන් කවරේද යත් ;

## 1. <u>ගිවිසුම් කාල සීමාව</u>

1.1. මෙම ගිවිසුම වර්ෂ xxxxxxxxxxx දින සිට ක්‍රියාත්මක වේ.
1.2. මෙම ගිවිසුමේ කාල සීමාව වර්ෂ එක (01) ක් වන අතර එය වර්ෂ xxxxxxxxxxx වන දින සිට වර්ෂ xxxxxxxxxxx වන දින දක්වා කාල සීමාවේ.

## 2. <u>ගිවිසුම්කරුගේ අයිතින් සහ යුතුකම්</u>

2.1. මෙහි සඳහන් කර ඇති පරිදි <u>කොන්ත්‍රාත්</u> ලේඛන වල දක්වා ඇති කොන්දේසි වලට කොන්ත්‍රාත්කරු යටත් විය යුතුය.
2.2. මින් මතුවට "ආහාර සැපයුම් සේවා" ලෙස ප්‍රණීත ආහාර පාන, සහ වෙනත් සේවාවන් <u>කොන්ත්‍රාත්කරු</u> විසින් පළමු පාර්ශවය වෙත සැපයිය යුතුය.
2.3. කොන්ත්‍රාත්කරු ආහාර පාන අනුමත මිල ගණන් යටතේ අමාත්‍යාංශ පරිශ්‍රයේ කාර්ය මණ්ඩලයට අලෙවිකර යුතු අතර එකී අනුමත මිල ගණන් ආපනශාලාව තුළ ප්‍රදර්ශනය කළ යුතුය.

2.4. මෙකි මිල සහ ගාස්තු <u>කොන්ත්‍රාත්කරු</u> විසින් ඉහළ නොදැමිය යුතු අතර මෙකී මිල ගණන් වෙනස් කිරිමට අවශ්‍ය අවස්ථාවල දී ක්‍රීඩා අමාත්‍යාංශ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ සභාපතිගේ අනුමැතිය ලබා ගත යුතුය.

2.5. කොන්ත්‍රාත්කරු විසින් ආහාර සැපයීමේ සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලුම බලපත්‍ර, අවසර සහ අනුමත කිරීම් ලබා ගෙන තිබිය යුතු වන අතර පළාත් පාලන ආයතනයේ ව්‍යවස්ථාවන්ට සහ නීති රෙගුලාසිවලට යටත්ව ආපනශාලාව පවත්වාගෙන යායුතුයි.

2.6. කොන්ත්‍රාත්කරු විසින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ආහාර පාන සේවා සිදු කිරිම සඳහා අදාල සහ අවශ්‍ය සියලුම නීති, රෙගුලාසි සහ කොන්දේසි වලට අනුකූල විය යුතුය.

2.7. ඉහත 2.5 වගන්තිය යටතේ දැක්වෙන බලපත්‍ර ලබා ගැනීමට අපොහොසත් වීම සහ වෙනත් කිසිදු නීතියක්, රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරිමට අපොහොසත් වීම හේතුවෙන් ඇතිවිය හැකි වගකීම් පිරිවැය, වියදම්, අලාභය, හානිය හෝ හිමිකම් පෑමට එරෙහිව පළමු පාර්ශවයට වන්දි ගෙවිය යුතුය.

2.8. පළමු පාර්ශවයේ ලිඛිත අනුමැතියකින් තොරව ආපනශාලව තුළ හෝ ඉන් පිටත කිසිදු වෙළඳ දැන්වීමක් හෝ  සංකේත පුවරුවක් කොන්ත්‍රාත්කරු විසින් නොතැබිය යුතුය.

2.9.1980 අංක 26 දරන ආහාර පනත සහ එහි සංශෝධනය හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසි අනුව ආපනශාලව තුළ ආහාර සැපයීය යුතු අතර ආහාර පිසීම සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය, එළවළු, මස්, මාළු, පළතුරු නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් ගබඩා කළ යුතුය.

2.10. ආහාර මිලදී ගන්නන් හට පැහැදිලිව තෝරා ගත හැකි පරිදි සෞඛ්‍යාරක්ෂිතව ප්‍රදර්ශනය කර තැබිය යුතු අතර ප්‍රධාන ආහාර වේල් “ බුෆේ” ක්‍රමයට හෝ ඉල්ලුම් කරන ආකාරය අනුව ලබා දීමේ ක්‍රමයට නිකුත් කළ යුතුයි.

2.11. සපයන ලබන ආහාර වල රසය සහ පෝෂණ ගුණය ඉහළ තත්ත්වයක පැවතිය යුතු අතර (විශේෂයෙන් පිසින ලද ආහාර, මස්,මාළු,බිත්තර, කිරි මිශ්‍ර ආහාර) උපරිම පැය හතර (04) ක් ඇතුළත අලෙවිය අවසන් කළ යුතුය.

2.12. ආපනශාලාව තුළ මත්පැන්, දුම්වැටි සහ බුලත්විට විකිණීම සපුරා තහනම් වේ.

2.13. ආපනශාලාව පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා විවෘතව තැබිය යුතුයි.

2.14. ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ නීති හා රෙගුලාසි අනුව එහි පාලන අධිකාරිය විසින් නම් කළ පෙදෙසක ආරක්ෂිතව ආවරණය කරන ලද බඳුන්වල මුළුතැන්ගෙයි ඇතුලු සියලු කසල සහ අපද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් එකතු කල යුතු අතර නියමිත පරිදි එකී කුණු කසල බැහැර කිරිමට අවශ්‍ය පියවර ගත යුතු අතර එකී නම් කරන ලද ප්‍රදේශවල පිරිසිදුකම සඳහා කොන්ත්‍රාත්කරු වගකිය යුතු අතර සියලුම අපද්‍රව්‍ය බැහැර කිරීමේ රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

2.15. කොන්ත්‍රාත්කරු විසින් ආහාර පිළියෙල කිරිමට යොදා ගන්නා ස්ථානයේ සහ ආපනශාලාව ඇතුලත සෑම සනීපාරක්ෂක ත්ත්තවය සෑම විටම ඉහළම මට්ටමකින් පවාත්වාගෙන යා යුතු අතර කොන්ත්‍රාත්කරු සෑම විටම ගබඩා ස්ථානය, උපකරණ, සේදුම් ප්‍රදේශය සහ සේවකයින්ගේ නවාතැන් හා වැසිකිළි සියල්ල පිරිසිදුව තබා ගත යුතුය. එමෙන් ම කොන්ත්‍රාත්කරු භාවිතා කරන සියලුම ප්‍රදේශ කෘමි හා පළිබෝධ වලින් තොර බවට සහතික කළ යුතු අතර ආහාර පාන සහ නම් කරන ලද ස්ථාන සනීපාරක්ෂක බවට කොන්ත්‍රාත්කරු විසින් සහතික කළ යුතු වන අතර ආහාර සැපයීමේ සේවාවන්ට අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුයි.

## 3. ආපන ශාලාවේ සේවකයින්

3.1. කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් ආපනශාලාවේ ආහාර සකස් කිරිමේ සහ පිළි ගැන්වීමේ කටයුතු සඳහා යොදා ගත යුතු අතර එම සේවකයින් සුදුසු පරිදි අදාළ වන කම්කරු නීති රෙගුලාසි වලට අනුව පරිපාලනය කළ යුතුය.

3.2.එකී සේවකයින් ආහාර පිළියෙළ කිරීම හා පිළිගැන්වීම සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබා ඇති බවට කොන්ත්‍රාත්කරු විසින් සහතික කළ යුතුය.

3.3.සෑම වසරකට ම වරක් රජයේ පිළිගත් වෛද්‍යවරයෙක් මගින් කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යොදවා ඇති සියලුම කාර්ය මණ්ඩලය වෛද්‍ය පරීක්ෂණයට ලක් කරන බවට කොන්ත්‍රාත්කරු සහතික විය යුතු අතර බෝ වන රෝගවලින් නොපෙලෙන සෞඛ්‍ය සම්පන්න නිරෝගී පුද්ගලයින් පමණක් ආපනශාලාව තුළ සේවයේ යොදවා ඇති බවට කොන්ත්‍රාත්කරු සහතික විය යුතුයි.

3.4.කොන්ත්‍රාත්කරු විසින් ආපනශාලාවේ ආහාර පිළියෙල කිරීමේ සහ පිළිගැන්වීමේ කාර්ය මණ්ඩලයට අමතරව පිරිසිදු කිරිමේ කාර්යය සඳහා ප්‍රමාණවත් වන පරිදි අමතරව සේවකයින් යොදා ගත යුතුය.

3.5.ආපනශාලාවේ සේවය සඳහා යොදා ගනු ලබන සේවකයින් පිළිබඳ සියලු විස්තර කොන්ත්‍රාත්කරු විසින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) වෙත ලබා දී අදාල අනුමැතිය ලබා ගත යුතුයි.

3.6.කොන්ත්‍රාත්කරු විසින් සෑම විටම සනීපාරක්ෂක හා පිරිසිදු හිස් ආවරණ ඇතුළු සුදුසු නිල ඇඳුම් තම කාර්යය මණ්ඩලයට සැපයිය යුතු වන අතර සියලුම සේවකයින් සිය රාජකාරි කාල වේලාවන් ඇතුළත නියමිත නිල ඇඳුම පැළඳ සිටිය යුතුයි.

3.7.මෙම ගිවිසුමට අනුකූලව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ පරිශ්‍රයේ කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් වරින් වර ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් පනවා ඇති සියලුම ආරක්ෂක සහ සනීපාරක්ෂක රෙගුලාසි වලට අනුකූල වන බවට කොන්ත්‍රාත්කරු සහතික විය යුතුය.

## 4. ඇප තැන්පතු හා මාසික කුලිය

4.1.................................................වන දින අත්සන් තබන ලද ගිවිසුමේ ප්‍රකාරව ආපනශාලාවේ ප්‍රයෝජනය සඳහා භාර දී ඇති භාණ්ඩ හා උපකරණ ගොඩනැගිලි ආරක්ෂාව, ඉදිරි කුලී ගෙවීම තහවුරු කිරිම වෙනුවෙන් රු.100,000/-ක මුදල් තැන්පතුවක් ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ ගරු භාණ්ඩාගාරික වෙත ලබාදී රිසිට්පතක් ලබාගත යුතුය. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් පළමු පාර්ශවය වෙත ලබා දී ඇති රුපියල් ලක්ෂක (රු.100,0000/-) බැංකු තැන්පතුව ආරක්ෂක තැන්පතුවක් ලෙස ගිවිසුමේ වර්ෂයක කාලය වන xxxxxxxxxxxx දින දක්වා වලංගු වේ.

4.2.ඉහත 4.1 වගන්තියෙහි සඳහන් ආරක්ෂක තැන්පතුව ආපනශාලාවේ යම් හානි පූරණයකට අයකර ගැනීමට මුදලක් නොමැති නම් ගිවිසුම් කාල ගත අවසානයේ හෝ ගිවිසුම් අවසන් කිරිමෙන් මාස (01) ක් ඇතුළත පළමු පාර්ශවය විසින් පොලී රහිතව ආරක්ෂක තැන්පතුව කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතුය.

4.3.කොන්ත්‍රාත්කරු විසින් සෑම මසකම 15වන දිනට ප්‍රථම ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ භාණ්ඩාගාරික වෙත ආපනශාලාවේ මාසික කුලිය ලෙස රුපියල් හතළිස් දහසක් (රු.40,000.00) ක මුදල් ගෙවා ලදුපතක් ලබා ගත යුතුය.

5. <u>ආපන ශාලාවේ නඩත්තුව</u>

5.1.පළමු පාර්ශවය විසින් ආපන ශාලාවේ ප්‍රයෝජනය සඳහා කොන්ත්‍රාත්කරු වෙත භාණ්ඩ ලබා දෙන අතර එකී භාණ්ඩ ගිවිසුම අවසානයේ නිසි පරිදි නැවත භාර දිය යුතුය. මෙකී භාණ්ඩ නැතිවීම හෝ අලාභහානී සිදු වීම මත එම භාණ්ඩයේ වර්තමාන වෙළඳපොළ වටිනාකම හා 25%ක රජයේ ගාස්තුව ඉහත 4.1 වගන්තියේ දැක්වෙන ආරක්ෂක තැන්පතුවෙන් අය කරනු ලබයි.

5.2.ආපන ශාලාවේ ආහාර පිළියෙල කිරිම හා එම ආහාර වල ප්‍රමිතිය උසස් තත්වයේ පැවතිය යුතු අතර පළමු පාර්ශවය විසින් නම් කරන ලද නිලධාරින්ගෙන් සමන්විත කමිටුවකට ඕනෑම අවස්ථාවක ආහාර වල ප්‍රමිතිය හා පවිත්‍රතාවය පරීක්ෂා කිරීමට කොන්ත්‍රාත්කරු අවසර දිය යුතු වන අතර සෞඛ්‍ය සේවා නිලධාරින්ගේ සහ මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් ආහාරපාන වල සෞඛ්‍ය ප්‍රමිතියට ආදළ බවට වරින් වර පරීක්ෂාවටල ලක් කරහොත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය.

5.3.ඉහත 5.2 වගන්තියේ සඳහන් කමිටුවේ නිර්දේශ වාර දෙක (02) කට වැඩි අවස්ථා වලදී ක්‍රියාත්මක කිරිමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වූවහොත් ආයතනයේ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමය විසින් මෙම කොන්ත්‍රාත්තුව අවසන් කරනු ලබයි.

6. <u>සාමාන්‍ය</u>

6.1.පළමු පාර්ශවයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ආපන ශාලා ගොඩනැගිල්ලේ කිසිදු ව්‍යුහාත්මක වෙනස් කිරිමක් කොන්ත්‍රාත්කරු විසින් නොකළ යුතුය.

7. <u>ගිවිසුමට ආදාළ නීති</u>

7.1.පාර්ශවකරුවෙකු විසින් මෙහි සඳහන් කොන්දේසි අනුව කටයුතු කිරිමට අපොහොසත් වූවහොත් අනෙක් පාර්ශවය විසින් ඔහුට ඒ සම්බන්ධයෙන් වැඩ කරන දින විසි එක (21) ක් ඇතුළත ලිඛිතව දැන්වීමක් කළ යුතු අතර අපොහොසත් වූ පාර්ශවය විසින් එකී දැන්වීම ලැබුනු දින සිට දින හත (07) ක් ඇතුළත එකී වරද නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය.

7.2.මෙම ගිවිසුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වලංගු නීති මඟින් බැඳී පවතී.

8. <u>සම්පූර්ණ ගිවිසුම</u>

මෙම ගිවිසුම මඟින් පාර්ශවකරුවන් අතර වන සම්පූර්ණ ගිවිසුම සංස්ථාපනය වන අතර මීට පෙර පාර්ශවකරුවන් අතර මෙම කරුණු සම්බන්ධයෙන් ඇති කර ගන්නා ලද ලිඛිත සහ/ හෝ වාචික ඇතොත් ඒ සියලුම ගිවිසුම් සහ කොන්දේසි මෙම ගිවිසුම මඟින් අවලංගු වේ.

9. <u>ස්වාභාවික ව්‍යසන</u>

පාර්ශවකරුවන්ගේ සාධාරණ පාලනයෙන් තොර යුද්ධ, ගිනි, කලකෝලහල, සිවිල් අරගලය, සුළිසුළං, ගංවතුර, නායයාම්, වර්ජන, වසංගත, දේව ක්‍රියා, රාජ්‍යතාන්ත්‍රික ක්‍රියා ඇතුළු පාර්ශවකරුවන්ගේ පාලනයට ඔබ්බෙන් වූ ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු විය හැකි අලාභයන් හෝ ගිවිසුම නියමයන් කඩවීම සම්බන්ධයෙන් කිසිදු පාර්ශවයක් වගකීමට නොබැඳේ.

**10.** <u>**හානිපූරණය**</u>

කොන්ත්‍රාත්කරු හෝ ඔහුගේ සේවකයන් සිදු කරනු ලබන නීති හා රෙගුලාසි කඩවීමක්, මෙම ගිවිසුමේ සඳහන් කොන්දේසි සහ නියමයන්ට අනුකූලව කටයුතු නොකිරීමන් හෝ පැහැර හැරීමක් යනාදී කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් ඇතිවිය හැකි වගකීමක් , වන්දි ඉල්ලීමක්, දඩයක්, වියදමක්, හානියක්, නෛතික ගාස්තුවක් සහ/හෝ වියදමක් ඇතුළු කිසිදු වගකීමක් පිළිබඳව පළමු පාර්ශවය වගකීමට නොබැඳෙන බවට දෙපාර්ශවයම එකඟ වේ.

**11.** **දැන්වීම**

පාර්ශවකරුවන්ට යවනු ලබන දැන්වීම එකී එක් එක් පාර්ශවය වෙත ලියාපදිංචි තැපැල මඟින් සහ/හෝ පුද්ගලිකව අතින් සහ/හෝ විද්‍යුත් තැපැල් (Email) මඟින් මෙහි ඉහතින් සඳහන් කරන ලද ලිපිනයට භාර දීමෙන් නිසි පරිදි භාර දුන් බවට සලකනු ලබයි.

**12.** <u>**ගිවිසුම් අවසන් කිරීම**</u>

12.1. ඕනෑම පාර්ශවකරුවෙකු විසින් අනෙක් පාර්ශවය වෙත දින තිහ (30) ක පූර්ව ලිඛිත දැන්වීම මඟින් මෙම ගිවිසුම අවසන් කරනු ලැබිය හැකිය.

12.2. කොන්ත්‍රාත්කරු පළමු පාර්ශවයේ ගෞරවයට හානි වන අයුරින් ක්‍රියා කර තිබුහොත් ඒ සම්බන්ධව විධිමත් විමර්ශනයකින් අනතුරුව පළමු පාර්ශවය විසින් කරනු ලබන ලිඛිත පූර්ව දැනුම් දීමකින් ගිවිසුම අවලංගු කරනු ලබයි.

12.3. මෙම ගිවිසුම අවලංගු කිරිමෙන් අනතුරුව වුවද පාර්ශවයන් වෙත ලැබිය යුතු වන්දි, අලාභ, හානි පූරණය කිරීම සම්බන්ධයෙන් වන වගකීම සහ අයිතිවාසිකම් අවසන් නොවේ.

එයට සාක්ෂි පිණිස ක්‍රීඩා අමාත්‍යාංශ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමය වෙනුවෙන් එහි ගරු සභාපති......................................................ත්......................................................වෙනුවෙන් එහි හිමිකරු................................................වන මම / අපි මෙයටත් මෙහි ඉහත සඳහන් දින කොළඹ දී අත්සන් තැබුවෙමි.

ක්‍රීඩා අමාත්‍යාංශ
සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමයේ ගරු සභාපති
.....................................ගේ අත්සන }

............................හි නිල මුද්‍රාව සහ එහි
හිමිකරු.............................ගේ අත්සන }

සාක්ෂි

මීට සාක්ෂිකාරයන් වන අප මෙහි අත්සන් කළ අය හොඳාකාරවම හඳුරන බවද ඒ දෙපක්ෂයේ නියම නම් රක්ෂාවල් සහ පදිංචි ස්ථානත් නිසියාකාරව දන්නා බව ද මෙයින් සහතික කර ප්‍රකාශ කරමු. }

1.

2.

## <u>ආපන ශාලා මිල ගණන් දැක්විය යුතු උපලේඛන</u>

| අංක | විස්තරය | මුළු බර ග්‍රෑම් | අමාත්‍යාංශයේ නිලධාරීන් | | බාහිර පුද්ගලයන් සඳහා | |
|---|---|---|---|---|---|---|
| | | | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් |
| 1 | **කෑම පිඟානට හෝ පාර්සලයකට අසුරන ලද**<br><br>**අ) <u>එළවළු කෑම එකක මිල</u>**<br><br>සම්බා සහලින් පිසූ බත් ග්‍රෑම් 225ක්, එළවළු 03ක් සමඟ මැල්ලුමක් හෝ සලාදයක්<br>(අවම බර ග්‍රෑම් 400 කට නොඅඩු විය යුතුය) | 400 | | | | |
| 2 | ආ) **<u>මාළු කෑම එකක මිල</u>**<br><br>සම්බා සහලින් පිසූ බත් ග්‍රෑම් 250ක්, ග්‍රෑම් 50ක් බරින් යුත් මාළු සහිත හොද්දක්<br>එළවළු 02ක් සමඟ මැල්ලුමක් හෝ සලාදයක්<br>(අවම බර ග්‍රෑම් 400 කට නොඅඩු විය යුතුය) | 400 | | | | |
| 3 | ඇ) **<u>මස් කෑම එකක මිල</u>**<br><br>සම්බා සහලින් පිසූ බත් ග්‍රෑම් 250ක්, ග්‍රෑම් 50ක් බරින් යුත් මස් සහිත හොද්දක්<br>එළවළු 02ක් සමඟ මැල්ලුමක් හෝ සලාදයක්<br>(අවම බර ග්‍රෑම් 400 කට නොඅඩු විය යුතුය) | 400 | | | | |
| 4 | ඇ) **<u>බිත්තර (තම්බන ලද) හෝ ඔම්ලට් කෑම එකක මිල</u>**<br><br>සම්බා සහලින් පිසූ බත් ග්‍රෑම් 250ක්, තම්බන ලද බිත්තරයක් හෝ ඔම්ලට් එකක්<br>එළවළු 02ක් සමඟ මැල්ලුමක් හෝ සලාදයක්<br>(අවම බර ග්‍රෑම් 400 කට නොඅඩු විය යුතුය) | 400 | | | | |

අයදුම්කරුගේ නම:- ……………………………………………………………………………………

අත්සන:-……………………………………

| අංක | විස්තරය | මුළු බර ගෘම් | අමාත්‍යාංශයේ නිලධාරින් | | බාහිර පුද්ගලයන් සඳහා | |
|---|---|---|---|---|---|---|
| | | | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් |
| 5 | ඉ) <u>කරවල කෑම එකක මිල</u><br><br>සම්බා සහලින් පිසූ බත් ගෑම් 225ක්, ගෑම් 25 කට නොඅඩු ඉස්තරම් වර්ගයේ කරවල ව්‍යාංජනයක් (කට්ටා,තෝරා,පරා)<br>එළවළු 02ක් සමඟ මැල්ලුමක් හෝ සලාදයක්<br>(අවම බර ගෑම් 400 කට නොඅඩු විය යුතුය) | 400 | | | | |
| 6 | හාල් පිටි ඉඳි ආප්ප 10 ක් පොල් සම්බෝල හෝ පොල් මැල්ලුම් සමඟ | 135 | | | | |
| 7 | තිරිඟු පිටි ඉඳි ආප්ප 10 ක් පොල් සම්බෝල හෝ පොල් මැල්ලුම් සමඟ | 135 | | | | |
| 8 | පිට්ටු කෑල්ලක් කිරිහොදි සමඟ | 70 | | | | |
| 9 | කිරිබත් කෑල්ලක් කට්ට සම්බල් සමඟ | 70 | | | | |
| 10 | තම්බන ලද මුං ඇට පීරිසියක් (කට්ට සම්බෝල හා පොල් සම්බෝල | 160 | | | | |
| 11 | තම්බන ලද කඩල පීරිසියක් (කට්ට සම්බෝල හා පොල් සමග) | 160 | | | | |
| 12 | තම්බන ලද මඤ්ඤොක්කා/ බතල පීරිසියක් (කට්ට සම්බෝල හා පොල් සමඟ) | 160 | | | | |
| 13 | එළවළු සමඟ තෙම්පරාදු කල නූඩ්ල්ස් පීරිසියක් | 175 | | | | |
| 14 | පාන් බාගයක් | 225 | | | | |
| 15 | රෝස් පාන් ගෙඩියක් | 112 | | | | |
| 16 | පරිප්පු පීරිසියක් (මයිසූර්) | 50 | | | | |
| 17 | මාළු පීරිසියක් (40g මාළු කෑල්ලක් සමඟ) | 50 | | | | |
| 18 | අල පීරිසියක් | 50 | | | | |
| 19 | මස් පීරිසියක් (40g කුකුල් මස් කෑල්ලක් සමඟ) | 50 | | | | |
| 20 | තම්බන ලද බිත්තරයක් | 40-50 | | | | |
| 21 | බිත්තර රොටියක් | 115 | | | | |
| 22 | එළවළු රොටියක් | 90 | | | | |
| 23 | ඔම්ලට්/ බුල්සායි එකක් | 40 | | | | |
| 24 | මස්/ මාළු රොටියක් | 90 | | | | |
| 25 | පොල් රොටියක් | 70 | | | | |
| 26 | තෝස එකක් | 50 | | | | |

අයදුම්කරුගේ නම:- ……………………………………………………………………………………

අත්සන:-……………………………………

| අංක | විස්තරය | මුළු බර ග්‍රෑම් | අමාත්‍යාංශයේ නිලධාරින් | | බාහිර පුද්ගලයන් සඳහා | |
|---|---|---|---|---|---|---|
| | | | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් |
| | කෙටි කෑම | | | | | |
| 27 | පරිප්පු වඩේ එකක් | 40 | | | | |
| 28 | උළුඳු වඩේ එකක් | 60 | | | | |
| 29 | චයිනිස් රෝල්ස් එකක් | 90 | | | | |
| 30 | මාළු පාන් එකක් | 100 | | | | |
| 31 | බිත්තර පාන් එකක් | 90 | | | | |
| 32 | ඔම්ලට බනිස් එකක් | 90 | | | | |
| 33 | කිඹුලා බනිස් එකක් | 75 | | | | |
| 34 | ප්ලේන් බනිස් එකක් | 55 | | | | |
| 35 | ක්‍රීම් බනිස් එකක් | 65 | | | | |
| 36 | සීනි බනිස් එකක් | 75 | | | | |
| 37 | ඩබල් බනිස් එකක් | 130 | | | | |
| 38 | ජෑම් බනිස් එකක් | 100 | | | | |
| 39 | ස්පන්ච් එකක් | 50 | | | | |
| 40 | වන්ඩු කේක් කෑල්ලක් | 50 | | | | |
| 41 | කේක් කෑල්ලක් (බටර්) | 45 | | | | |
| 42 | සමෝසා එකක් | 50 | | | | |
| 43 | මාළු/ මස් කට්ලට් එකක් | 50 | | | | |
| 44 | මාළු/ මස් පැටිස් එකක් | 50 | | | | |
| 45 | ලැවරියා එකක් | 70 | | | | |
| 46 | සීනි සම්බල් පිරිසියක් | 40 | | | | |
| 47 | පැණි ආප්ප | 40 | | | | |
| 48 | සුදු ආප්ප | 40 | | | | |
| 49 | වැලි තලප | 70 | | | | |
| 50 | තල කැරලි | | | | | |
| 51 | පැන් කේක් | 70 | | | | |
| 52 | හැලප එකක් | 60 | | | | |
| 53 | සැන්ඩ්විච් | 75 | | | | |
| 54 | | | | | | |
| | පාන වර්ග | | | | | |
| 55 | කහට තේ එකක් (ප්ලේන්ටි) | | | | | |
| 56 | කිරි තේ එකක් | | | | | |
| 57 | කෝපි එකක් | | | | | |
| 58 | කිරි කෝපි එකක් | | | | | |
| 59 | නෙස් කැෆේ කෝප්ප 01 | | | | | |
| 60 | නෙස් ටී කෝප්ප 01 | | | | | |
| 61 | කිරි පැකට් (මි.ලි.180) | | | | | |
| 62 | කොළ කැඳ | වීදුරු 01 ක් | | | | |
| 63 | සුප් | කෝප්ප 01ක් | | | | |
| 64 | නැවුම් පළතුරු බීම | වීදුරු 01 ක් | | | | |
| 65 | පැෂන් | වීදුරු 01 ක් | | | | |
| 66 | දෙහි | වීදුරු 01 ක් | | | | |
| 67 | ගස්ලබු | වීදුරු 01 ක් | | | | |
| 68 | දිවුල් | වීදුරු 01 ක් | | | | |
| 69 | අලිගැට පේර | වීදුරු 01 ක් | | | | |

අයදුම්කරුගේ නම:- …………………………………………………………………………………

අත්සන:-……………………………………

| අංක | විස්තරය | මුළු බර ග්‍රෑම් | අමාත්‍යාංශයේ නිලධාරින් | | බාහිර පුද්ගලයන් සඳහා | |
|---|---|---|---|---|---|---|
| | | | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් |
| | <u>**පළතුරු/ අතුරුපස**</u> | | | | | |
| 70 | ඇඹුල් කෙසෙල් ගෙඩියක් | | | | | |
| 71 | පුවාලු/ කෝලි කුට්ටු ගෙඩියක් | | | | | |
| 72 | ආනමාළු/ ඇඹුන් ගෙඩියක් | | | | | |
| 73 | අයිස් ක්‍රීම් (මි.ලි.80) | | | | | |
| 74 | යෝගට් (මි.ලි. 80) | | | | | |

| අංක | ෆයිඩ් රයිස් සඳහා මිල ගණන් (කෑම පිඟානකට පාර්සලයකට අසුරන ලද) | මුළු බර ග්‍රෑම් | අමාත්‍යාංශයේ නිලධාරින් සඳහා | | බාහිර පුද්ගලයින් සඳහා | |
|---|---|---|---|---|---|---|
| | | | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් | ඒකක මිල රු.ශත | මිල අකුරෙන් |
| 01 | කීරි සම්බා ෆ්‍රයිඩ් රයිස් (එළවළු දමන ලද) | 400 | | | | |
| 02 | කීරි සම්බා ෆ්‍රයිඩ් රයිස් (බිත්තර දමන ලද) | 400 | | | | |
| 03 | කීරි සම්බා ෆ්‍රයිඩ් රයිස් (මස් හෝ මාළු සමඟ එළවළු දමන ලද) | 400 | | | | |

<u>**විශේෂ උත්සව සඳහා ආහාර වල මිල**</u>

විශේෂ උත්සව අවස්ථාවල දී ලබා ගැනීම සඳහා පහත සඳහන් ආහාර වල මිල දන්වන්න.

| අංක | විස්තරය | ඒකක මිල | |
|---|---|---|---|
| | | රු | ශත |
| 01 | කීරි සම්බා ෆ්‍රයිඩ් රයිස් එකක් (එළවළු දමන ලද) | | |
| 02 | කීරි සම්බා ෆ්‍රයිඩ් රයිස් එකක් (බිත්තර දමන ලද) | | |
| 03 | කීරි සම්බා ෆ්‍රයිඩ් රයිස් එකක් (මස් හෝ මාළු දමන ලද) | | |
| 04 | ග්‍රෑම් 70 ක් බර කිරිබත් කෑලි එකක් | | |
| 05 | ග්‍රෑම් 30 ක් බර කොණ්ඩ කැවුම් එකක් | | |
| 06 | කොකිස් එකක් | | |
| 07 | කෝලිකුට්ටු | | |
| 08 | තේ කෝප්පයක් (ප්ලේන්ටි) | | |
| 09 | තේ කෝප්පයක් (කිතුල් හකුරු කැබැල්ලක් සමඟ) | | |
| 10 | බෙලිමල් කොප්පයක් එකක් (හකුරු සමඟ) | | |
| 11 | ලුණු මිරිස් | | |
| 12 | හැලප එකක් | | |
| 13 | පොල් රොටී 02ක් මැදට ලුණු මිරිස් යොදා | | |
| 14 | නෙස් කැෆේ කෝප්ප 01 | | |
| 15 | නෙස් ටී කෝප්ප 01 | | |

අයදුම්කරුගේ නම:- ………………………………………………………………………………….

අත්සන:-…………………………………